සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

46 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. "මා මරණයෙන් අමරණීයත්වයට ගෙන යනු මැනව" යනුවෙන් සඳහන් වන්නේ,
(1) මහා භාරතයේ ය. (2) රාමායණයේ ය.
(3) බෘහත්සම්හිතාවේ ය. (4) බ්‍රාහ්මණයේ ය.
(5) උපනිෂද්වල ය.

2. 'සංස්කෘතිය' යන්නට පුරාණ සාහිත්‍ය ග්‍රන්ථවල භාවිත වූ වචනය,
(1) මරබු ය. (2) සාල්බු ය. (3) කලාව ය. (4) දර්ශනය ය. (5) විනය ය.

3. මන්ත්‍රවලට අදාළ පිළිවෙත්වලට වැදගත්කමක් දෙන වේදය
(1) ඍග් වේදය ය. (2) යජුර් වේදය ය. (3) සාම වේදය ය. (4) අථර්ව වේදය ය. (5) ධනුර් වේදය ය.

4. ඍග් වේදය සඳහන් කරන යාග පිළිවෙත් භාරව කටයුතු කරන්නා,
(1) හෝද්‍රා ය. (2) සිවාචාරියාර් ය. (3) උත්කාද්‍රා ය.
(4) අලංකරණාචාරියාර් ය. (5) අත්වර්යු ය.

5. හින්දු සංස්කෘතියේ සංගීත සම්ප්‍රදාය වර්ධනය වීමට පුරෝගාමී වූයේ,
(1) නාට්‍ය ශාස්ත්‍ර ය. (2) යජුර් වේදය ය. (3) සාම වේදය ය.
(4) භගවත් ගීතාව ය. (5) ආයුර්වේදය ය.

6. 'ආරණ්‍යගම්' යන්න පැහැදිලි කරන්නේ කුමක් පිළිබඳව ද?
(1) බ්‍රහ්මචර්ය ජීවිතය (2) වානප්‍රස්ථයන්ට අයත් ආගමික වන්දනා ක්‍රම
(3) පවුල් ජීවිතය පිළිබඳ ධර්මය (4) මරණයෙන් පසුව පවතින ජීවිතය
(5) දේවාල සම්ප්‍රදාය

7. 'අර්ථශාස්ත්‍රම්' යන ග්‍රන්ථයේ කර්තෘ
(1) පරාසරර් ය. (2) මනු ය. (3) වසිට්ටර් ය.
(4) කෞටිල්‍ය ය. (5) රාමානුජර් ය.

8. විෂ්ණු දෙවියන්ගේ අවතාර තුනක නම් ඇතුළත් වරණය කුමක් ද?
(1) ආනන්ද සයනර්, ක්‍රිෂ්ණර් හා කූර්මම් (2) නාරායනර්, වියාසර් හා බුද්ධ
(3) මත්ස්‍යම්, වාමනම් හා කූර්මම් (4) ක්‍රිෂ්ණර්, පාදරායනර් හා බුද්ධ
(5) කල්කි, වෛගුන්ද පෙරුමාල් හා වාසුදේවන්

9. 'ගණවල නායකයා' යන විශේෂත්වයට අයත් දෙවියන්
(1) විනායගර් ය. (2) විෂ්ණු ය. (3) කාන්දර්වර් ය.
(4) වීරපත්තිරර් ය. (5) බෛරවර් ය.

10. උතුරු ඉන්දීය භක්ති ව්‍යාපාරයේ නායකයන් තිදෙනෙකු වන්නේ,
(1) නාමදේවර්, අප්පෛය තීට්සිදර් සහ ශ්‍රී සෛදන්යර් ය.
(2) තුලසිදාසර්, විපුලානන්දර් සහ කස්තූරිබායි ය.
(3) රාමානන්දර්, කබීර්දාසර් සහ නාමදේවර් ය.
(4) මීරාබායි, රාමානන්දර් සහ ශංකරර් ය.
(5) තුලසිදාසර්, කබීර්දාසර් සහ අරුණගිරිනාදර් ය.



Department of Examinations, Sri Lanka

11. ආර්ය සමාජය බිහි කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) රාජාරාම් මෝහන්රායි (2) සුවාමි විවේකානන්දර්
(3) දයානන්ද සරස්වති (4) අන්නි පෙසන්ට් මව්තුමිය
(5) සිත්පවානන්දර්

12. යාපනයේ ශෛව පරිපාලන සභාව පිහිටුවීමට පුරෝගාමී වූයේ,
(1) ඉන්දුපෝට් රාසරත්තිනම් ය. (2) විත්තුව සිරෝමණි න. ස. පොන්නම්බලපිල්ලෙ ය.
(3) සුවාමි විපුලානන්දර් ය. (4) ශෛවපුලවර් කා. අරුණාසල තේසිගර් ය.
(5) පණ්ඩිතමණි සී. කණපතිපිල්ලෙ ය.

13. ශ්‍රී ලංකාවේ ගීතිකාවෙන් පිදුම් ලද දේවාල මොනවා ද?
(1) පොන්නම්බලවානේශ්වරම් හා නගුලේශ්වරම්
(2) වන්නෙ වෛතීශ්වරර් දේවාලය හා චන්ද්‍රසේකරේශ්වරම්
(3) තිරුකෝණේශ්වරම් හා තිරුකේදීශ්වරම්
(4) වානවන් මාදේවීශ්වරම් හා තිරුකෝණේශ්වරම්
(5) නගුලේශ්වරම් හා මුන්නේශ්වරම්

14. කලායෝගි ආනන්ද කුමාරස්වාමිතුමා කලාවේ බිහිවීම පිළිබඳව ලබා දෙන විශේෂ පැහැදිලි කිරීම කුමක් ද?
(1) පිරිසිදු සිත් ක්‍රියාකාරකම (2) ආගමික විශ්වාසයේ ප්‍රකාශය
(3) කලා රස වින්දනය (4) පිළිමවල විශේෂතා
(5) ගෝපුරයේ නිර්මාණය

15. 'ස්තහදි' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) දේවාල නිර්මාණයට මුදල් උපකාර ලබා දෙන්නා ය.
(2) දේවාල ගෘහ නිර්මාණ කලාවේ ප්‍රවීණයා ය.
(3) දේවාල පරිපාලනය කරන්නා ය.
(4) දේවාලවල පංචපුරාණම් ගයන්නා ය.
(5) දේවාල පිළිවෙත්වල නිපුණතා ඇති අය ය.

16. පල්ලව යුගයේ සමහර සෙල්ලිපිවල 'පෙරිය කට්ටලි' යනුවෙන් විශේෂයෙන් සඳහන් වන දේවාලය,
(1) ධර්මරාජ රථය ය. (2) තිරිමූර්ති ශාලාව ය.
(3) කාංචි කෛලාසනාථ දේවාලය ය. (4) මණ්ඩගප්පට්ටු ය.
(5) වල්ලම් ය.

17. ශිව දේවාලවල විමාන කෝෂ්ටවල සඳහන් වන දෙවිවරුන්ගේ නම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) දක්ෂිණාමූර්ති, මහාවිෂ්ණු, බ්‍රහ්මන්, කාමාන්තහර්
(2) ලිංගෝට්පවර්, දක්ෂිණාමූර්ති, බ්‍රහ්මන්, දූර්ගා
(3) දක්ෂිණාමූර්ති, ලිංගෝට්පවර්, බ්‍රහ්මන්, විෂ්ණු
(4) තිරිපුරාන්දගර්, ලිංගෝට්පවර්, කාලාරිමූර්ති, විනායගර්
(5) උමාමහේෂ්වරර්, කාමාන්තහර්, අර්ධ නාරීසුවරර්, සෝමාස්කන්දර්

18. පිළිම කලාවේ 'සිලා පරීක්ෂණම්' මගින් සැලකෙන්නේ,
(1) ලෝහය තෝරා ගැනීම ය. (2) සුභ නැකත තෝරා ගැනීම ය.
(3) පිළිමයට අදාළ ද්‍රව්‍ය තෝරා ගැනීම ය. (4) දැවය තෝරා ගැනීම ය.
(5) ගල තෝරා ගැනීම ය.

19. මුල් ආල්වාර්ලා යනුවෙන් ප්‍රශංසා ලබන තිදෙනා වන්නේ,
(1) නම්මාල්වාර්, පේයාල්වාර් සහ ආණ්ඩාල් ය.
(2) පොයිගෛයාල්වාර්, පූදත්තාල්වාර් සහ පේයාල්වාර් ය.
(3) පෙරියාල්වාර්, නම්මාල්වාර් සහ පේයාල්වාර් ය.
(4) පූදත්තාල්වාර්, ආණ්ඩාල් සහ තොණ්ඩරඩි පොඩියාල්වාර් ය.
(5) පොයිගෛයාල්වාර්, පෙරියාල්වාර් සහ නම්මාල්වාර් ය.

20. හින්දු සංස්කෘතිය දකුණු ආසියාතික රටවල පැතිරවීම කෙරෙහි බලපෑ සාහිත්‍ය කෘති වන්නේ,
(1) මහාභාරතය, රාමායණය සහ නාට්‍ය ශාස්ත්‍රය ය.
(2) සුක්‍රනීදි, ශ්‍රී භාෂ්‍යම් සහ මහාභාරතය ය.
(3) රාමායණය, වේදාන්ත සූත්‍රය සහ ආත්තිසූඩි ය.
(4) නාට්‍ය ශාස්ත්‍රය, මානසාරම් සහ මනිමේහලෙ ය.
(5) සිලප්පදිකාරම්, ශ්‍රී භාෂ්‍යම් සහ වේදාන්ත සූත්‍රය ය.

Department of Examinations, Sri Lanka

21. බෞද්ධ ආගමේ මූලික සිද්ධාන්තය වන පංචශීල විනයට ඇතුළත් කරුණු තුනක් වන්නේ,
    (1) මත්පැන් නොබීම, දේව රූප වන්දනා කිරීම සහ පවුල් ජීවිතයේ ආචාරධර්ම රැකීම ය.
    (2) පොළොවේ නිදා ගැනීම, දත් නොමැදීම සහ සිටගෙන කෑම ය.
    (3) සතුන් නොමැරීම, සොරකම් නොකිරීම සහ මත්පැන් නොබීම ය.
    (4) පැණිරස නොකෑම, රට නොකෑම සහ බොරු නොකීම ය.
    (5) අනුන්ගේ බිරියන් සමඟ ආශ්‍රය නොකිරීම, දත් නොමැදීම සහ කිරි නොබීම ය.

22. දකුණු ආසියාවේ අංගෝර්වාට් දේවාලය පිහිටා ඇති රට කුමක් ද?
    (1) සම්බා (2) ජාවා (3) මැලේසියාව (4) තායිලන්තය (5) කම්පුචියාව

23. "වේදම් නාන්ගිනුම් මෙයිප්පොරුල් ආවදු නාදන් නාමම් නමසිවායවේ" යනුවෙන් පංච අක්ෂර මන්ත්‍රය ප්‍රශංසා කර ගැයුවේ,
    (1) අප්පර් ය. (2) මාණික්කවාසගර් ය. (3) සම්බන්ධර් ය.
    (4) සුන්දරර් ය. (5) කාරෛක්කාල් අම්මයාර් ය.

24. කාසිවාසි සෙන්දිනාදෛයර් රචනා කළ ග්‍රන්ථවලින් තුනක නම් ඇතුළත් කාණ්ඩය වන්නේ,
    (1) ප්‍රබුලිංග ලීලයි, වේදාන්ත සූඩාමණි, සිද්ධාන්ත සූඩාමණි ය.
    (2) පරාබරක්කන්නි, පරිපූරණානන්දම්, පරසිව වනක්කම් ය.
    (3) ප්‍රමාණ තීබිගෛ, ශිවයෝග සාරම්, ශිවයෝග රත්තිනම් ය.
    (4) ශෛව සමය චින්තාමනි, මෙයිඥාන තීබම්, මුරුගන් මගත්තුව නුට්පම් ය.
    (5) ඥානරත්තිනාවලි, වච්චිර තණ්ඩම්, ශෛව වේදාන්තම් ය.

25. ලිංගෝට්පවර් හැඩයෙන් පිළිබිඹු කෙරෙන දර්ශනය කුමක් ද?
    (1) දෙවියන්ගේ පස් වාර්ගික ක්‍රියා (2) එඩිය ඇති අය දෙවියන්ට ළඟා විය නොහැකි ය.
    (3) විවාහ යුගලය (4) ඇදුරුතුමාගේ දර්ශනය
    (5) ආත්ම දර්ශනය

26. "කුනිත්ත පුරුවමුම් කොව්වෛ සෙව්වායිට් කුමිණ් සිරිප්පුම්..." යන අප්පර්ගේ තේවාර ගිතිකාවෙන් වර්ණනා කරනු ලබන දෙවියන්
    (1) විනායගර් ය. (2) මහාමාරි ය. (3) නඩරාජර් ය. (4) මුරුගන් ය. (5) තිරුමාල් ය.

27. මත්තුවර් විවරණ ග්‍රන්ථ ලියුවේ පහත සඳහන් කුමන ග්‍රන්ථවලට ද?
    (1) වේදාන්ත සූත්‍රය, දශෝපනිෂද්, භගවත් ගීතාව
    (2) භගවත් ගීතාව, බ්‍රහ්මපුරාණම්, කඨෝපනිෂද්
    (3) වේදාන්ත සූත්‍රය, ශ්‍රී භාෂ්‍යම්, භගවත් ගීතාව
    (4) බ්‍රහ්ම සූත්‍රය, කල්ප සූත්‍රය, බ්‍රහ්ම පුරාණම්
    (5) පාහවද පුරාණම්, ශ්‍රී භාෂ්‍යම්, කල්ප සූත්‍රය

28. 'ශෛව සිද්ධාන්තය' යන්නෙහි අර්ථය කුමක් ද?
    (1) තුන්ද්‍රව්‍ය (2) ත්‍රිමල (මුම්මලම්)
    (3) තුන් ක්‍රියා (4) ශෛව ආගමේ තීරණාත්මක තීරණ
    (5) විමුක්ති වර්ග හතර

29. වේදවල ඥාන කාණ්ඩය යනුවෙන් ප්‍රශංසා කරනු ලබන්නේ,
    (1) සංහිතෛහල් ය. (2) ප්‍රාමණංගල් ය. (3) ආරණියගංගල් ය.
    (4) වේදාංගංගල් ය. (5) උපනිෂද් ය.

30. උපනිෂද් ගොනුකර බ්‍රහ්මසූත්‍රය යන නමින් රචනා කරනු ලැබුවේ,
    (1) වේදව්‍යාසර් විසිනි. (2) යාක්ඥවල්කියර් විසිනි.
    (3) පාදරායනර් විසිනි (4) නිම්පාක්කර් විසිනි.
    (5) නාරදර් විසිනි.

31. භගවත් ගීතාව පැහැදිලි කරන කර්ම යෝගයේ ප්‍රධාන උපදේශය කුමක් ද?
    (1) කරන කාර්යයේ තපස (2) ගිහි ජීවිතය
    (3) බ්‍රහ්මචරියාව (4) ඥානය
    (5) භක්තිය

32. 'දරවල ගින්න සේ බ්‍රහ්ම දර්ශනය සැඟවී ඇත' යනුවෙන් සඳහන් කරන උපනිෂද්,
    (1) මුණ්ඩක උපනිෂද් ය. (2) ඓදරේය උපනිෂද් ය.
    (3) මාණ්ඩූක්‍ය උපනිෂද් ය. (4) සුවේදාස්වදර උපනිෂද් ය.
    (5) කඨෝපනිෂද් ය.



Department of Examinations, Sri Lanka

33. බ්‍රහ්ම සූත්‍රයට රාමානුජර් විසින් ලියන ලද විවරණ ග්‍රන්ථය
 (1) වේදාන්ත සාරම් ය. (2) ශ්‍රී භාෂ්‍යම් ය. (3) වේදාන්ත දීපම් ය.
 (4) වේදාන්ත සංග්‍රහම් ය. (5) අද්වෛද සූඩාමනී ය.

34. මෙලොව ජීවත් වෙමින් සිටිය දී ම ලබා ගන්නා විමුක්තිය,
 (1) පරමුත්ති ය. (2) පදමුත්ති ය.
 (3) සාලෝග මුත්ති ය. (4) විදේහ මුත්ති ය.
 (5) සීවන් මුත්ති ය.

35. 'තෙන්පුලත්තාර්' යනුවෙන් තිරුවල්ලුවර් විසින් සඳහන් කරනු ලබන්නේ,
 (1) අමුත්තන් ය. (2) මලවුන් ය. (3) අසල්වැසියන් ය.
 (4) මිතුරන් ය. (5) අදුරුතුමන්ලා ය.

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

36. **පුරාණම් හින්දු සංස්කෘතියේ මූලාශ්‍රයයි,**
 (1) දකුණු ඉන්දියානු ශෛව හා ජෛන සම්ප්‍රදායට පුරාණම් කිසිදු බලපෑමක් සිදු කළේ නැත.
 (2) ගුප්ත යුගයේ හින්දු සංස්කෘතිය පුරාණම් මගින් දියුණු විය.
 (3) පුරාණම්වලට පස් වාර්ගික ලක්ෂණ ඇත. මේවාත් සමග තවත් ලක්ෂණ ද පුරාණංගල් සතුව ඇත.
 (4) පුරාණම් දේවාල වන්දනාව, උපවාසවල වැදගත්කම, තීර්ත්තම්වල වැදගත්කම, වන්දනා ගමන්, තපසේ වැදගත්කම යන ඒවා පිළිබඳ විස්තර කරයි.
 (5) පුරාණම් පැරණිතම ග්‍රන්ථ ලෙස පැවති අතර වේදවලින් විස්තර කෙරෙන චින්තන පැහැදිලි කිරීමත් සමඟ ම දෙවි ඉතිහාසය පැතිරවීමේ අරමුණක් සහිතව ද වර්ධනය විය.

37. **සාක්ත මාර්ගයේ පැරණිකම හා උසස් බව**
 (1) ශක්ති දෙවියන් මුල් කොටගෙන කෙරෙන වන්දනාව සාක්ත වන්දනාව වේ.
 (2) සාක්ත මාර්ගය විශේෂත්වයක් ලබන්නේ ශෛව ආගම හා එක්වූ විට පමණි.
 (3) උශෛ, රාත්‍රී යන දෙවිවරුන්ගේ වන්දනාව ශක්ති දෙවියන්ගේ වන්දනා ක්‍රමයේ අංග පිළිබිඹු කරයි.
 (4) ශක්ති දෙවියන්ට උචිත උපවාසවල නවරාත්‍රී උපවාසය, ආඩිපූරම්, වරලක්ෂ්මී උපවාසය යන ඒවා විශේෂිතයි.
 (5) මහාකවි භාරතියාර් වෙනත් දෙවිවරු ප්‍රශංසා කරන තරමට ශක්ති දෙවියන්ට ප්‍රශංසා කළේ නැත.

38. **මෙයිකණ්ඩ ශාස්ත්‍ර සම්ප්‍රදාය**
 (1) ශෛව සිද්ධාන්තයේ මූල් ග්‍රන්ථය ලෙස විශේෂත්වයක් දරන්නේ සිවඥානපෝදම් ය. එහි කර්තෘ මෙයිකණ්ඩාර් ය.
 (2) ශෛව ආගමික කුරවර්ලා විසින් කරන ලද තේවාරම්, තිරුවාසහම් වැනි ආශිර්වාද ලත් තිරුමුරයිවලට සන්ධාන කුරවර්ලා දිෂ්ඨි තත්ත්වයෙන් රචනා කරන ලද සිද්ධාන්ත ග්‍රන්ථ සාහිත්‍ය ලෙස සැලකිය හැකි ය.
 (3) සිවඥානපෝදම් රෞරව ආගමම්හි තේරුම විස්තර කරන අයුරින් සකසා ඇති බව පැවසේ.
 (4) උමාපති සිවාචාරියර් මෙයිකණ්ඩ ශාස්ත්‍ර ග්‍රන්ථ අතුරෙන් ග්‍රන්ථ පහක කර්තෘවරයායි.
 (5) සිවඥානසිත්තියාර් සිවඥානපෝදම් ග්‍රන්ථයේ ආශ්‍රය ග්‍රන්ථයකි.

39. **ශෛවපුලවර් අරුණාසල තේසිගර් හා මඩකලපුවේ ස්වදේශ ව්‍යාපාරය**
 (1) ආරුණසල තේසිගර් මඩකලපුවේ ශෛව ආගමික ස්වදේශ ව්‍යාපාරයට දායක වී සිටියේ ය.
 (2) මොහු අවුරුදු හතළිහක් ආනෛපන්දි ශෛව පාසලේ මුල් ගුරුවරයා ලෙස සේවය කළේ ය.
 (3) මොහු පාසල් වේලාවට අමතරව සවස්වරු පාසල, රාත්‍රී පාසල යන ඒවා ද ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාව මත පැවැත්වූ ආගමික නායකයෙකි.
 (4) මොහුගේ ආගමික දැනුම හා සේවා ප්‍රශංසා කර මඩකලපුවේ දෙමළ කලා සංගමය 1952 හි දී 'තේසිගමණි' යන ගෞරව නාමයෙන් පුදන ලදී.
 (5) මොහු සොයා ගෙන ඉගෙන ගැනීමට හෝ උගතුන් ඇසුරු කොටගෙන ඥානය වැඩි කර ගැනීමට හෝ ඇල්මක් දැක්වූයේ නැත.

40. **ඖවෛයාර්ගේ ආත්තිසූඩි ග්‍රන්ථයේ විශේෂතා**
 (1) ධර්මයට අදාළ ග්‍රන්ථ රචනා කළ ඖවෛයාර් චෝල යුගයට අයත් කෙනෙකුයැයි විද්වතුන් සලකයි.
 (2) ඇය රචනා කළ ග්‍රන්ථ අතර ආත්තිසූඩි යන ග්‍රන්ථය ද අඩංගු ය. එය මහජනයා හොඳ ගතිගුණයෙන් පූර්ණ ජීවිතයක් ගත කිරීමට මග පෙන්වන ග්‍රන්ථයකි.
 (3) ආත්තිසූඩි ඉතාමත් කෙටි ග්‍රන්ථයකි. එය වේද හා උපනිෂද් අදහස්වල සාරාංශයක් ලෙස පවතින්නක් බව පැවසේ.
 (4) ආත්තිසූඩි තේරුම් සහිත ගීතිකාවලින් රචනා වී ඇත.
 (5) ආරුමුග නාවලර්තුමා 1851 දී ආත්තිසූඩි හා කොන්ඩ්‍රයිවේන්දන් යන ඒවා තම 'පාලපාඩම්' පළමුවැනි පොතේ මුද්‍රණය කර ප්‍රකාශයට පත් කළේ ය.



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

● පහත දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>වායු පුරාණම් | B<br>වෛදික ධර්මය පිහිටුවීම | C<br>කාමාණ්ඩක නිදිසාරම් | D<br>කනිෂ්කන් | E<br>බ්‍රහ්ම සිද්ධාන්තය |
| F<br>මුද්‍රාව පැලඳීම | G<br>පංච සිද්ධාන්තය | H<br>සුත්ති යන තීට්සෛ | I<br>තාශ්‍ය නාමය පැලඳීම | J<br>ගාන්ධාර කලාව |

41. ජෛන සම්ප්‍රදායේ තිබෙන පංච සම්ස්කාරම් යන වන්දනා ක්‍රම දෙකක් සඳහන් යුගලය
(1) A F (2) B I (3) C I (4) E F (5) F I

42. උතුරු ඉන්දියාවේ පැවති කුෂාණ පාලන සමය හා සම්බන්ධ යුගලය
(1) A C (2) B H (3) D G (4) D J (5) E J

43. හින්දු භක්තිකයන්ගේ පුරාණ තර්ක ශාස්ත්‍රය පිළිබඳව දැන ගැනීමට උපකාරී වන ග්‍රන්ථ යුගලය
(1) A E (2) A J (3) B H (4) E G (5) E H

44. නූතන හින්දු සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය වන ආර්ය සමාජයේ ප්‍රතිපත්ති ඇතුළත් යුගලය
(1) A B (2) B C (3) B H (4) C H (5) E H

45. ගුප්ත යුගයේ හින්දු සංස්කෘතික වර්ධනය පිළිබඳව දැන ගැනීමට උපකාරී වන ග්‍රන්ථවල නම් ඇතුළත් කාණ්ඩය
(1) A C (2) B H (3) D F (4) E G (5) F G

● අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු ඒවා **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>ශිලාලිපි | F<br>සේයෝන් | K<br>මන්ත්‍ර | P<br>ආගමික සමරස සන්මාර්ක්කම් |
| B<br>ඕමකුණ්ඩම් | G<br>නායන්මාර් පඩිමංගල් | L<br>කාසි | Q<br>තට්සනෛ |
| C<br>වේදාරණ්‍යම් | H<br>ටැම්ලිපි | M<br>වෙරියාට්ටු | R<br>රාජරාජේශ්වරම් |
| D<br>මායෝන් | I<br>අග්නි | N<br>ලෝහ කැටයම් | S<br>විදේශික විද්වතුන්ගේ සටහන් |
| E<br>සදූර්වේදි මංගලම් | J<br>තාපස ජීවිතය | O<br>අනුභූදි තත්ත්වය ලබා ගැනීම | T<br>නඩුකල් |

46. හින්දු ශිෂ්ටාචාරයේ ඉතිහාසය දැන ගැනීමට උදව් වන මූලාශ්‍ර සඳහන් වන කාණ්ඩය
(1) A H L S (2) A G L R (3) B H M S (4) C I L R (5) E F L P

47. යාග පිළිවෙත්වල සිදුවන කාර්ය සඳහන් වන කාණ්ඩය
(1) A I L T (2) B I K Q (3) C H M R (4) D G O R (5) E F L T

48. සංඝ යුගයේ ආගමික මාර්ගය හා සම්බන්ධ කරුණු සඳහන් වන කාණ්ඩය
(1) A I M S (2) B J K P (3) D F M T (4) D I L R (5) E H O Q

49. තායුමාන ස්වාමිහල්ගේ ආගමික ජීවන රටාව පිළිබඳව සඳහන් වන කාණ්ඩය
(1) A F N Q (2) B G L R (3) C J O P (4) C I M P (5) E J O R

50. ශ්‍රී ලංකාවේ පොළොන්නරුව යුගයේ හින්දු ආගමික කලා ඉතිහාසය හා සම්බන්ධ කරුණු සඳහන් වන කාණ්ඩය
(1) A F N Q (2) C I L T (3) D I L R (4) E G N R (5) E J L T

* * *

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

AL/2017/46/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. හින්දු ශිෂ්ටාචාරය වර්ධනයේ සිවාගමම්වල වැදගත්කම පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විමසන්න.
   (අ) 'සිවාගමම්' යන්නෙහි අර්ථය
   (ආ) සිවාගමම් මගින් වර්ධනය වන භක්ති මාර්ගය
   (ඉ) ශිල්ප කලා

2. චෝල රජ සමයේ ශෛව ආගම වර්ධනය වූ ආකාරය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   (අ) චෝල රජවරුන්ගේ සහභාගිත්වය හා කාර්ය
   (ආ) ශෛව ආගමික වර්ධනය
   (ඉ) කලා වර්ධනය

3. හින්දු ආගමික කොටස් හයෙන් එකක් වන කෞමාර මාර්ගයේ විශේෂතා පහත සඳහන් කරුණු ඇසුරෙන් විමසන්න.
   (අ) මුරුග වන්දනාවේ ආරම්භය හා වර්ධනය
   (ආ) මුරුග දෙවියන්ගේ විශේෂ දේවාල
   (ඉ) කෞමාර මාර්ගය පිළිබඳ සාහිත්‍ය

## II කොටස

4. හින්දු සංස්කෘතික වර්ධනයේ සංගීතය, නර්තනය වැනි ශිල්ප කලා වර්ධනය වූ ආකාරය පරීක්ෂා කරන්න.

5. හින්දු ආගමික දාර්ශනික ඉතිහාසයේ සංකරර්ගේ අත්වෛදම්වලට හිමි වන වැදගත්කම පහත සඳහන් කරුණු ඇසුරෙන් විමසන්න.
   (අ) සංකරර්ගේ කාලය
   (ආ) ඔහුගේ දාර්ශනික මූලධර්මයේ ප්‍රධාන අංග
   (ඉ) වේදාන්තය හා ආගමික ජීවිතය

6. ශෛව සිද්ධාන්තය විස්තර කරන ආත්මය පිළිබඳ සංකල්පයත්, ආත්මය පරිණතියට පත්වීමට අදාළ ක්‍රියාපිළිවෙතත් පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (අ) ආත්මයේ ස්වභාවය
   (ආ) ආත්මය හා ත්‍රිමල (මුම්මලම්)
   (ඉ) ආත්මය පරිණතියට පත් වීමට අදාළ ක්‍රියාපිළිවෙත හා විමුක්තිය

7. "ධර්ම ශාස්ත්‍රවල අරමුණු වන්නේ හින්දු ආගමේ සුරක්ෂාව පිණිස ජනතාවට සරිලන ධර්ම මාර්ගය පිළිබඳව පැහැදිලි කිරීමයි." පහත සඳහන් මාතෘකා ඔස්සේ මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න.
   (අ) ධර්ම ශාස්ත්‍රවල තේරුම
   (ආ) ස්ව ධර්ම හා සමාජ ධර්ම
   (ඉ) රාජ්‍ය ධර්ම

8. පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
   (අ) උපනිශද්
   (ආ) රාමායණය
   (ඉ) අරුමුග නාවලර්තුමා
   (ඊ) වල්ලිපුරම් ආල්වාර් දේවාලය
   (උ) ගෘහ ජීවිතයේ වන්දනාව
   (ඌ) හින්දු ගණිතය

* * *

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka